# අපරාධ වළක්වාලීමෙහි ලා බෞද්ධාගමික මගපෙන්වීම

පියුමි කංකානම්ගේ[1]

## හැඳින්වීම

මිනිසා විසින් කරනු ලබන කිසියම් චර්යාවක් අපරාධයක් යැයි නිර්වචනය කරනු ලබන්නේ කෘතීම ලෙස ඔහු විසින් ම නිර්මාණය කර ගන්නා ලද ආචාරධර්ම පද්ධතියකට සාපේක්ෂවය. එහෙත් මිනිසාගේ සාමාන්‍ය ජන්ම ගති ස්වභාවයන්ට අනුව සලකා බලන විට පැහැදිලි වන්නේ එකී තත්ත්වය ඔහුට උරුම සාමාන්‍ය හැසිරීමක් බවයි. ශිෂ්ටාචාරගත සත්ත්වයෙකු බවට පත් වූ තැන් සිට මිනිසා තමා විසින් ම නිර්මාණය කරන ලද ආචාරධර්ම අභියස වහලෙකු බවට පත් වී ඇත. එහෙයින් ඔහුට ස්වකීය ජන්ම ගති ස්වභාවයන් පසෙකලා ස්වකීය වර්ගයා බලාපොරොත්තු වන කෘතීම ජීවන ක්‍රමයට අනුගතව සමාජීය සත්ත්වයෙකු ලෙස ජීවත්වීමට සිදු වී ඇත. බුදු දහම මගින් මිනිසාගේ මෙකී ජන්ම ගති ස්වභාව මැනවින් තේරුම්ගෙන ඇති අතර අපරාධ හා සම්බන්ධ බෞද්ධ විග්‍රහය මූලික වශයෙන් ගොඩනැගී ඇත්තේ මිනිසාගේ ජන්ම ගති ස්වභාවයන් සක්‍රියවීමට ඇති ඉඩප්‍රස්තා කල්වේලා ඇතිව ම වළක්වාලීම අරමුණුකොට ගෙනය.

'සබ්බේ සත්තා උන්මත්තකා' යනුවෙන් බුදුන්වහන්සේ විසින් දේශනාකොට ඇත. ඉන් ගම්‍ය වන්නේ මිනිසා නොමිනිසෙකු වීමේ ගුණය සියලු මිනිසුන් තුළ උරුමයක් ලෙස රෝපණය වී ඇති බවයි. නොමිනිස්කම් යනු සාමය, සමාදානය, සාධාරණය, දයාව, කරුණාව, පරිත්‍යාගශීලිත්වය, අන්‍යෝන්‍ය උපකාරය, අව්‍යාජත්වය, හොඳ, නරක වැනි මිනිස් වර්ගයාගේ පැවැත්මට අත්‍යවශ්‍යයෙන් ආරක්ෂාකර පවත්වාගෙන යා යුතු, ගුණධර්මවලින් වියෝවී හුදෙක් ආත්මාභිලාසයෙන් ම කරනු ලබන හැසිරීමකි. මෙවැනි ගති පැවතුම් ඇති තැනැත්තා සමාජය පෙළන අපරාධකාරයෙකි. එහෙයින් මෙකී උන්මත්තකයා සදාචාරශීලී යහපත් පුරවැසියෙකු බවට පත් කරගත යුතු වන අතර බෞද්ධ ඉගැන්වීම් පුරාවට ඒ සඳහා අවශ්‍ය වන්නා වූ මගපෙන්වීම ලබාදෙනු ලැබේ.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණයෙන් අපේක්ෂා කරන්නේ, අපරාධ වැළැක්වීම සඳහා බෞද්ධාගමික ඉගැන්වීම්වලින් ලැබෙන්නා වූ දායකත්වය කොතෙක්ද යන්න පිළිබඳව අධ්‍යයනය කිරීමයි. අධ්‍යයනය ද්විතියික දත්ත පදනම් කරගෙන සිදු කරනු ලැබූ අතර එහි දී අධ්‍යයන මාතෘකාව හා සම්බන්ධ පොත්පත්, සඟරා හා

1 සමාජ විද්‍යා අධ්‍යයන අංශය, රුහුණ විශ්වවිද්‍යාලය. piumimadushanik@gmail.com

අන්තර්ජාලය උපයෝගි කරගනු ලැබිණ. අධ්‍යයනයේ දී සවිස්තරාත්මකව ගුණාත්මක දත්ත විශ්ලේෂණයක් සිදු කරනු ලැබේ.

**ප්‍රතිඵල**

ගිහි සමාජ චර්යාව පාලනය කිරීම සඳහා බුදු දහමින් නිර්දේශිත ඉතාමත් සරල ප්‍රඥප්තිය පංචශීලයයි. පංචශීලයෙන් දැක්වෙන ප්‍රතිපත්ති පහ ආරක්ෂාකර ගැනීමට කවර හෝ සමාජයක වැසියන් සමත් වුවහොත් එහි අපරාධයැයි වර්ග කරනු ලබන මාදිලියේ මනුෂ්‍ය චර්යාවන් කිසිවක් වාර්තා නොවනු ඇත. දෛනිකව සිදු වන අපරාධ දෙස බලන විට පැහැදිලි වන්නේ ඒ සියල්ල පංචශීල ප්‍රතිපත්තියෙන් ආවරණය වන බල ප්‍රදේශය තුළ විසිරී ඇති බවයි. බෞද්ධ ඉගැන්වීමට අනුව මේ සියලු ව්‍යසනයන්ට මුල් වන ප්‍රධානත ම හේතුව ඉතාමත් සරලය. මිනිසා පංචශීල ප්‍රතිපත්තියෙන් වියෝ වී තම තමන්ගේ අභිමතය පරිදි ආත්මාර්ථකාමී ප්‍රතිපදාවක පිහිටා කටයුතු කිරීමට පෙළඹීම මේ සියල්ලට මුල් වී ඇත.

සදාචාරශීලී යහපත් පුරවැසියෙකු ගොඩනගා ගැනීම පිණිස බුදුන්වහන්සේ විසින් දේශනා කරන ලද සූත්‍ර ධර්ම රැසකි. මහා මංගල, පරාභව, සිගාලෝවාද, ව්‍යග්ඝපජ්ජ වැනි සූත්‍ර ඒ අතුරින් වැදගත්ය. සිගාලෝවාද සූත්‍රයේ මව්පිය දූ දරු සම්බන්ධතාවය, ගුරුවරයා හා ශිෂ්‍යයා අතර පැවතිය යුතු සම්බන්ධතාවය, ස්වාමිපුරුෂයා හා බිරිඳ අතර පැවතිය යුතු සම්බන්ධතාවය, මිතුරු මිතුරු සම්බන්ධතාවය, ස්වාමියා හා සේවකයා අතර සම්බන්ධතාවය හා පැවිදි සමාජය හා ගිහි සමාජය අතර පැවතිය යුතු සම්බන්ධතාවය පිළිබඳව දීර්ඝ වශයෙන් විශ්ලේශණය කර දක්වා ඇත. මෙහි දී සමාජ තත්ත්වය, කාර්ය කොටස්, සමාජ සම්බන්ධතා, සමාජ ව්‍යුහය, සමාජ ඒකාග්‍රතාවය, සමාජ සංවිධානය, අපගමනය වැනි ඉතා වැදගත් සමාජවිද්‍යාත්මක සිද්ධාන්ත රැසක් පිළිබඳව ක්‍රි. පූ. 06 වැනි සියවස් තරම් ඈත අවධියක දී ඉතාමත් ගැඹුරින් විශ්ලේෂණය කර තිබීම විශේෂත්වයකි. සාපරාධී පෞරුෂත්වයකින් තොර යහපත් පුරවැසියෙකු නිර්මාණය කරගැනීම එහි අවසන් ඉලක්කය විය. ඒ අනුව කිසියම් සමාජයක අපරාධ ඇතිවීමට පෙර එවැනි තත්ත්වයක් උද්ගත වීම වළක්වා ගැනීම කෙරෙහි විශේෂ උනන්දුවක් දැක්වීම බෞද්ධ ඉගැන්වීමෙහි ඇති විශේෂත්වය බව අධ්‍යයනයෙන් අනාවරණය විය.

**සාකච්ඡාව**

මහා මංගල සූත්‍රයේ දී 'පුත්ත දාරස්ස සංඝහො' යනුවෙන් බුදුන්වහන්සේ පෙන්වා දෙනු ලබන්නේ පවුල නමැති සමූහය තුළ උපත ලබන දූ දරුවන් රැක බලාගනිමින් නිසිමග යොමු කිරීම හා සම්බන්ධයෙන් දෙමව්පියන් වෙත පැවරෙන වගකීම පිළිබඳවයි. එපමණක් නොව සිගාලෝවාද සූත්‍රයෙහි එන දෙමාපිය දූ දරු සම්බන්ධතාව පිළිබඳ විග්‍රහයේ දී දෙමාපියන් විසින් ස්වකීය දරුවන් උදෙසා ක්‍රියා කළ යුතු ආකාරය මැනවින් පෙන්වා දී ඇත. දූ දරුවන් පවින් වළක්වාලීම, යහපත් මාර්ගයෙහි යොමු කරවීම, ධර්මශාස්ත්‍රාදිය උගැන්වීම, නිසි වයසේ දී ආවාහ විවාහ කරදීම, සුදුසු කාලය එළැඹි විට වස්තුව පවරා දීම යනු දෙමාපියන් විසින් සිය දරුවන් වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකම්ය. මෙම යුතුකම් නොපිරිහෙළා ඉටුවුවහොත් සමාජශීලී යහපත් පුරවැසියෙකු බිහි වේ. එම සූත්‍රයෙහිම ගුරු ශිෂ්‍ය සම්බන්ධතාව විග්‍රහ කර දක්වන බුදුන්වහන්සේ ගුරුවරයාගේ පාර්ශවයෙන් ඉටුවිය යුතු යුතුකම් 05 ක් පිළිබඳව ද වදාළහ. මනාකොට හික්මවීම, හොඳින් ශිල්ප ශාස්ත්‍ර උගැන්වීම, ශිෂ්‍යයා ඉගෙනුම ලබන පන්ති මට්ටමට සරිලන පරිදි උගැන්වීම, මිත්‍රාමාත්‍යදීන්ට හඳුන්වා දීම, ශිෂ්‍යයා ආරක්ෂා කිරීම යනු එම යුතුකම්ය. සිගාලෝවාද සූත්‍රයෙහි ඇසුරින් බැහැර කළ යුතු මිතුරන් සිව් දෙනෙකු පිළිබඳ දේශනා කොට ඇත. එනම් අඤ්ඤදත්ථුහර, වචීපරම, අනුප්පියභාණී හා අපායසහායක වශයෙනි. පව්ටු මිතුරන් ඇසුරින් රහමෙර පානය, නොකල්හි විථි සංචාරය, දූ කෙළිය, ස්ත්‍රී ධූර්තතාවය වැනි දුර්ගුණවලට ඇබ්බැහි වේ. ආශ්‍රය කළ යුතු කල්‍යාණ මිත්‍රයන් සිව් දෙනෙකු පිළිබඳව ද සිගාලෝවාද සූත්‍රයෙහි දැක්වේ. එනම් උපකාරක, සමාන සුඛදුක්ඛ, අත්ථක්ඛායි හා අනුකම්පක වශයෙනි. දෙමාපිය, වැඩිහිටි ගුරුභවතුන්ගේ නිසි මග පෙන්වීම හා යහපත් මිත්‍ර ආශ්‍රය ලබන්නන් සත්පුරුෂයන් වන අතර ඔවුන්ගෙන් සමාජයට අපරාධයක් සිදුවීමට ඇති ප්‍රවණතාව ඉතා අඩුය.

දීඝ නිකායේ චක්කවත්ති සීහනාද සූත්‍රයෙහි බුදුරජාණන්වහන්සේ විෂම සමාජයක් නිර්මාණය වන ආකාරය හා අපරාධ හටගන්නා ආකාරය විවරණය කර දැක්වූහ. රටක පාලකයා සතර සංග්‍රහ වස්තුවෙන්, දස රාජධර්මයෙන් රාජ්‍ය පාලනය ගෙන යා යුතු බව බුද්ධ දේශනාවයි. පාලකයා මෙවැනි ප්‍රතිපත්ති ආරක්ෂා වන පරිදි පාලනය මෙහෙය වන විට නිතැතින්ම යහපත් පාලනයක් හා සියල්ලෙන් සපිරි රටක් උරුම වේ. මෙවැනි කරුණුවලින් පැහැදිලි වන්නේ යහපත් සමාජයක් ගොඩනැගීමේ ක්‍රියාවලිය ඉහලින් ආරම්භ විය යුතු බවයි. ගිහි සමාජය පමණක් නොව සංඝ සමාජය ද මනා ශික්ෂණය කිරීමේ අවශ්‍යතාවය ද බුදුන්වහන්සේ හඳුනාගෙන ඇත. විමුක්තිය අරඹයා සසුන්ගත වන කෙනෙකු

චර්යාමය වශයෙන් සුවිශේෂ තත්ත්වයක් අපේක්ෂා කළ යුතු වන බැවින් බුදුන්වහන්සේ පැවිදි සමාජය ක්‍රමවත් කිරීම සඳහා නීති විශාල ප්‍රමාණයක් පනවා අත්තේ එබැවිනි.

**නිගමනය**

බෞද්ධ ඉගැන්වීම් මගින් පෙන්වා දි ඇති අන්දමට අපරාධ යනු පුද්ගලයා හා සමාජය අතර ගොඩනැගෙන පරස්පරයේ නැතහොත් පරතරයේ ප්‍රතිඵලයකි. බුදු දහම මගින් මෙකී පරස්පරතාවය මැනවින් තේරුම්ගෙන ඇත. නවීන අපරාධවිද්‍යාව මගින් මූලික වශයෙන් අපරාධ කළමනාකරණය කෙරෙහි අවධානය යොමු කරනු ලැබුව ද ක්‍රි. පූ. 06 වන සියවස තරම් ඈත අවදියක දී බිහි වන බුදු දහම මගින් ඒ දෙස හෙළනු ලබන දෘෂ්ටිය ඊට වඩා බොහෝ සෙයින් ගැඹුරුය. සියලු අපරාධවල වගඋත්තරකරුවා වන මිනිසාගේ ජන්ම ගති ස්වභාවයන් යටපත් කර ඔහුගේ ආත්මය සදාචාර ගති සිරිත්වලින් පෝෂණය කිරීම මගින් පමණක් එකී ඉලක්කය ජය ගත හැකි බව බුදු දහමේ ඉගැන්වීමයි. ඒ අනුව අපරාධවලින් මිදීමේ වඩාත් තර්කානුකූල හා පරිපූර්ණ මග බුදු දහමින් විවරණය කර ඇති අතර ඒ අනුව පැහැදිලි වන්නේ අපරාධවලින් ගහන වත්මන් ලෝක සමාජයට බුදු දහම ඇසුරු කළ යුතු කාලය එළැඹී ඇති බවයි.

**ප්‍රමුඛ පද** : අපරාධ වළක්වාලීම, බෞද්ධාගමික ඉගැන්වීම්, ආචාරධර්ම පද්ධතිය, සදාචාරශීලී යහපත් පුරවැසියන්

**ආශ්‍රිත ග්‍රන්ථ**

අභයසුන්දර, පි. (2002). *බෞද්ධ සමාජ පාලනය හා අපරාධ විද්‍යාව*, කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ.

ජයසිංහ, ඒ. කේ. ජී. (2013). *අපරාධවිද්‍යාව.* කඩවත: කඩුල්ල ප්‍රකාශන.

තේජෝරංසි හිමි, එච්.,. (1990). *අපරාධ පිලිබඳ බෞද්ධ මතය: සමාජවිද්‍යාත්මක විමර්ශනයකි.* ප්‍රගති කාර්මික පදනම.

හෙට්ටිආරච්චි, ඩී. (2001). *බෞද්ධ සමාජ විද්‍යා ප්‍රවේශය.* කොළඹ 10: දයාවංශ ජයකොඩි සහ සමාගම.

Ratnapala, N. (1993). *Crime and Punishment in the Buddhist Tradition*. New Delhi: India